41 වන පිටෙන්

- ශාරීරික පරීක්ෂා මගින් Digital rectal Examination හෙවත් ගුද මාර්ගය තුලින් ඇඟිල්ලක් යවා පුරස්ථි ග්‍රන්ථියේ ප්‍රමාණය හා ස්වභාවය නිර්ණය කිරීම.
- Prostate Specific Antigen (PSA) නැමැති රුධිර පරීක්ෂාව
- මූත්‍රාවල ආසාධනයක් හෝ රුධිරය ඇතිදැයි පරීක්ෂා කිරීම
- Ultra Sound Scan පරීක්ෂාව මගින් පුරස්ථි ග්‍රන්ථිය හා මුත්‍රා මාර්ගය පරීක්ෂා කිරීම
- Prostate Biopsy නැමැති පටක පරීක්ෂාව මගින් පිළිකා ඇති නැති බව තහවුරු කරගැනීම

### පුරස්ථි ග්‍රන්ථියේ රෝග සඳහා ඇති ප්‍රතිකාර මොනවාද ?

කරනු ලබන ප්‍රතිකාර ක්‍රමය කුමන රෝගයක් ඇතිද යන්න මත තීරණය වේ.

පිළිකාමය නොවන පුරස්ථි ග්‍රන්ථියේ විශාල වීම සඳහා ග්‍රන්ථියේ මාංශපේශී ලිහිල් කර ග්‍රන්ථිය කුඩා කරවන ප්‍රතිකාර ක්‍රම පවතී. සමහරවිට මුත්‍ර නාලය තෙරපීම වැලැක්වීම සඳහා ශල්‍ය කර්මියක් මගින් මුත්‍රා නාලය ගමන් කරන විවරව පළල් කිරීමක්ද සිදු කරනු ලැබේ.

පිළිකා සඳහා කරන ප්‍රතිකාර පිළිකාවේ ස්වභාවය, එය කෙතරම් දුරට පැතිරී ඇතිද යන්න හා රෝගියාගේ අනෙක් රෝගාබාධ, වයස, ඔහුගේ කැමැත්ත මත තීරණය වේ.

- Active Surveillance හෙවත්
- නිරන්තරයෙන් පරීක්ෂාවෙන් සිටීම
- ශල්‍යකර්මයක් මගින් ග්‍රන්ථිය ඉවත් කිරීම
- Radio Therapy හෙවත් විකිරණ ප්‍රතිකාර
- හෝමෝනමය ප්‍රතිකාර (Androgen Deprivation Therapy)
- Chemotherapy නැමැති ඖෂධමය ප්‍රතිකාර



වෛද්‍ය හර්ෂ අලුත්ගේ
Dr Harsha Aluthge
MBBS, FRACGP, DFM RCGP(UK)
General Practitioner
Greenvale Medical Centre




# පැරණි කෝලම් කලාවට නව ප්‍රවේශයක්

මෙල්බන් වික්ටෝරියා විශ්වවිද්‍යාලයයේ රංගනය පිලිබඳ දර්ශනපති (PhD) උපාධිය සඳහා අනසූයා සුබසිංහ විසින් රචනය කොට අධ්‍යක්ෂණය කරන ලද 'නොමළ කෝලම්' (My Sweet Rotten Heritance) නාට්‍යයේ දර්ශන දෙකක් පසුගිය වසරේ මේල්බන්හිදී සාර්ථකව වේදිකාගත විය. බොහෝ දෙනෙකුගේ ඉල්ලීම පරිදි එම නාට්‍යය නැවතත් මෙල්බන්හිදී වේදිකාගත වීමට නියමිතයි.

නොමළ කෝලම් නාට්‍යයට පාදක වී ඇත්තේ ශ්‍රී ලංකාවේ පාරම්පරික නාට්‍ය ක්‍රමයක් වන කෝලම් සම්ප්‍රදායයි.

කෝලම යාවත්කාලීන කළ හැක්කේ කෙසේද යන ගැටලුවයි. එනම් කාලීන සමාජ දේශපාලනික, ආගමික හා සංස්කෘතික තත්ත්වයන් හා බේදවාචකයන් නැවුම් චරිත හා කතා මාලාවන් උපයෝගී කරගෙන කෝලම් ශිල්පය ඔස්සේ කරලියට ගෙන ආ හැක්කේ කෙසේද යන්න අත්හදා බැලීම යි. ඒ සඳහා ඇය සාම්ප්‍රධායික කෝලම් නාට්‍ය ක්‍රමයේ ආකෘතිය ඇසුරු කිරීමට උත්සාහ දරා ඇත. එමෙන්ම ඓතිහාසික සිදුවීම්, දේව පුරාණයන්, මිථ්‍යා ප්‍රබන්ධයන්, එකිනෙකට මනාව සංකලනය කරමින් චරිත පහක් ඔස්සේ ඈඳුතු කතාංග පහක් නිර්මාණය කිරීමට සමත් වී ඇත.

වැලිගොඩපොල හා ඉෂාර වික්‍රමසිංහ කරලියට පණපොවන අතර, මලිත් හෑගොඩ නිෂ්පාදන කළමනාකාරිත්වය දරයි. ඕස්ටල්‍රේලියාවේ මෙල්බන් නුවර ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය ආදිශිෂ්‍ය සංගමයේ ප්‍රමුඛත්වයෙන් ඉදිරිපත් කෙරෙන 'නොමළ කෝලම්' 2018 ජූනි 15 වැනි දින පස්වරු 2.00 හා 6.30 වශයෙන් දර්ශන දෙකක් Rivergum Performing Arts Centre Hampton Park හිදී පැවැත් වීමට නියමිත අතර, මෙය ඔබට විරළ සෞන්දර්යාත්මක අත්දැකීමක් වනු නොඅනුමානය. ප්‍රවේශ පත්‍ර www. ausnewslanka.com වෙබ් අඩවියෙන්







කොලම්වල විශේෂත්වය වන්නේ ඒ ඒ චරිතවල ගති ස්වභාවයන් වෙස් මුහුණු මගින් නිරූපණය වීමයි. පැරණි කෝලම් ශිල්පීහු තත්කාලීන සමාජ, දේශපාලන, ආර්ථික, ආගමික, කුලමල ආදී සියළු අංශයන් ඒ හා බැඳුණු මතිමතාන්තර, අසාධාරනකම්, මදි පුංචිකම් වක්‍රාකාරයෙන් සමාජය ඉදිරියේ තැබීමට උපයෝගී කරගත් සාර්ථක නාට්‍ය ක්‍රමය මෙයයි.
වෙස්මුහුණුවලට අමතරව පහතරට නර්තනය, බෙරවාදනය, ගායනය අබිරූපනය, වේදිකා සැරසිලි, ඇඳුම ආයිත්තම් ආදී සකල අංගයන්ගෙන් ම පරිපූර්ණ වූ කෝලම් සම්ප්‍රදාය ඔස්සේ පැරැන්නෝ ඔවුන්ට සමාජයේ මුණගැහෙන ප්‍රභූන් මෙන්ම ගැමි සමාජයේ විවිධ තරාතිරම්වල අයගේ ක්‍රියාකලාපයන් නාට්‍යලන්කාරයෙන්, සියුම් ලෙස හාස්‍යයට හා උපහාසයට ලක්කළහ. මීට අමතරව බෞද්ධ විශ්වාස සහ ඇදහිලි ඔස්සේ සංකල්පනය කරගත් මනඃකල්පිත චරිතද කෝලම් මඩුවට එක් කර ගත්හ. කෙමෙන් අප අතරින් ඈත වන රංග ශිල්පයක් වුවද, අද ද කෝලම් මඩුවේ මෙන්ම ශ්‍රී ලාංකේය වේදිකාවේද මෙම කලාංගය යම් වශයෙන් හෝ දැකිය හැකිය. ඒහෙත් බොහෝ විට සාම්ප්‍රධායික චරිත හා කතාංගයන් ඒ ආකාරයෙන්ම රඟ දැක්වෙන අතර, සුළු වෙනසක් හෝ සිදුවන්නේ කලාතුරකිනි. එබැවින් පැරණි ශිල්පීන් අනුගමනය කළ පරිදි චරිත හා සිදුවීම්වල යාවත්කාලීන වීමක් පසුකාලීනව සිදු වී නොමැති බවක් පෙන්නුම් කරයි.

අනසූයාගේ අචාර්ය උපාධිය සඳහා පර්යේෂණයට ලක්ව ඇත්තේ සාම්ප්‍රධායික

සාම්ප්‍රදායික වශයෙන් කොලම්වල ස්ත්‍රී පුරුෂ සියලු චරිත රඟදක්වනු ලබන්නේ පුරුෂ පක්ෂය විසින් වුවත්, අනසූයා සිය කෝලම් මඩුව තුළට කාන්තා නියෝජනය සාර්ථකව ප්‍රවේශ කර ගනී. එමෙන්ම ඉංග්‍රීසි සිංහල ද්වීභාෂාවන්ගෙන් කෙරෙන සංවාදයන්, නර්තන, ගායන, වාදන කෞශල්‍යය, විටෙක හාස්‍ය හා උපහාසයත්,





විටෙක සංවේදී බවත් ජනිත කරමින් ප්‍රේක්ෂකයන්ගේ බුද්ධියට ආමන්ත්‍රණය කරයි.

මෙහි රංගනයෙන් හා වාදනයෙන් අනසූයා සුබසිංහ, ස්ටොන් තිරිමාන්න, ජිතේන්ද්‍ර විද්‍යාපති, දිනුපා කෝද්‍රාගොඩ, නදීක

හෝ 042234255 - නිශාන්ත, 0433762369 - අණුර, 0411029706 - ගාමිණී, හෝ 0414800283 - සුපින් අමතා ලබාගත හැකිය.

ගාමිණී රණසිංහ